"සුදු" නම් මනා/ලස්සන/යහපත් බවටත් , "කළු" නම් නරක/කැත බවටත් සංකේතාත්මකව මෙන්ම වචනාර්ථ හැඳින්වීමද අපට ආගන්තුක නොවේ. එසේම යම් පුද්ගලයෙකුගේ සමේ වර්ණය "සුදු" හෝ "කළු" වීම පාදක කරගනිමින් සිදුවන කොන් කිරීම් මෙන්ම විශේෂ කොට දැක්වීම්ද අප සමාජයන්ට ආගන්තුක නොවේ.

ඊට උදාහරණයක් ලෙස "සුදුම සුදු සුරූපී ජැකොලයින් කළුම කළු කතාවක පැටළෙයි" යනුවෙන් වූ සති අග අරුණ පුවත්පතේ පළවූ ලිපියක සිරස්තලය දැක්විය හැක.

එහිදී "සුදුම සුදු සුරූපී ජැකොලයින්" යනුවෙන් සිදුකරනා හැඳින්වීම ඔස්සේ, කාන්තාවක් ඇයගේ බාහිර ස්වරූපය ඔස්සේ ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීමක් නොවන්නේද? එසේ නම් එය ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් සිදුකරන කොන් කිරීමකි. එය සැබවින්ම ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවේද?

**#MediaEthicsSL #lka #sinhalanews #SundayAruna**